ID 534

# ජන කවියෙහි සංවාද කවි භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජේ.ඩී.අයි.ශෂිකලා *isurishashikala166@gmail.com*

අයි.එම්.ජේ.දහනායක *imjdahanayaka@gmail.com*

ආර්.කේ.කේ.ටී.පී පත්මතුංග *thilini.prasadi11@gmail.com*

එම්.යසින්ත දිල්ශාන් *myasinthadilshan@gmail.com*

මිනිසා භාෂාව පිළිබඳ ව හඳුනා ගැනීමෙන් පසු සිය සිතුවිලි අන්‍යයන්ට ප්‍රකාශ කිරීම සඳහා යොදාගත් අනේක විධ උපක්‍රම අතර ජන කවිය ද එක් ප්‍රභේදයකි. ලොව පවතින විවිධ සාහිත්‍යයන් හි වියත් කවි මෙන් ම ජන කවි ද අන්තර්ගත වේ. කාලාන්තරයක සිට ම පොදු ජනයා අතර පරපුරෙන් පරපුරට වාචෝද්ගත ව,අලිඛිත ව පැවත ඒ මේ හේතුව පදනම් කරගනිමින් ජන කවිය,ජනශ්‍රැති විශේෂයක් ලෙස සැලකෙයි. අතීත ජනයා නිරුත්සාහික ව සිතට නැගෙන සිතුවිලි කවියක් ලෙසින් අන් අයට ශ්‍රවනය වන සේ ගායනා කිරීම සිදු කර ඇත. ජන කාව්‍යයෙහි විවිධ ප්‍රභේද හඳුනාගත හැකි අතර,එහි එක් විශේෂ අංගයක් ලෙස සංවාදාත්මක ස්වරූපයෙන් රචිත ජන කවි දැක්විය හැකි ය.ජන කවිය පිළිබඳ කෙරෙන විග්‍රහයන් හි දී ජෝඩු සී පද ලෙස උක්ත කවි හඳුන්වා ඇත. ජන අත්දැකීම් ආශ්‍රය කරගෙන සංවාද කවි පටබැඳී ඇති බැව් ජන කවිය පිළිබඳ ව විමසීමේ දී පැහැදිලි වන කරුණකි. දෙදෙනෙකු හෝ බහු පාර්ශවයක් අතර සිදු වන කවි සංවාද,ජන කවි සාහිත්‍යයෙහි බහුල ව දක්නට ලැබේ. ආදරය,අනුරාගය,සුඛ-දුක්ඛ යනා දී නන්විධ තේමාවන් කරණකොටගෙන සංවාද කවි උද්භවය වී ඇති බැව් ජන සාහිත්‍යය විමසීමේ දී පෙනී යයි. මෙම පර්යේෂණයේ ගැටලුව බවට පත් වූයේ ජන කවියෙහි සංවාද කවි භාවිතය සිදු ව ඇත්තේ කෙසේ ද? යන්න විමර්ෂණය කිරීම යි. ජන කවියෙහි සංවාද කවි පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක නියැලීම,විද්‍යාර්ථීන්ට නව පර්යේෂණ මංපෙත් විවර කර දීම,එම සංවාද කවිවල භාෂා භාවිතය සහ සාහිත්‍යයික ලක්ෂණ සම්බන්ධ ව අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණු විය. මෙම පර්යේෂණයේ දී අන්තර්ජාලය සහ පුස්තකාලය පරිශීලනය,විෂය ප්‍රාමාණික විද්වතුන් සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා ආදිය දත්ත ගවේෂණය සඳහා භාවිත කෙරුණි. දත්ත විශ්ලේෂණයේ දී ජන කවිය සහ එහි ඉතිහාසය අධ්‍යයනය,ජන කවියෙහි සංවාද කවි භාවිත වූ අයුරු අධ්‍යයනය කිරීම,එම සංවාද කවිවල අන්තර්ගත කාව්‍යාලංකාර හඳුනා ගැනීම,සංවාද කවි පබැඳීමට පාදක කරගෙන ඇති වස්තුවිෂය පිළිබඳ තොරතුරු අධ්‍යයනය සිදු කරන ලදී. ජන සාහිත්‍යයෙහි උපේත සංවාද කවියෙහි වස්තුවිෂය,ලෝකෝත්තර තේමාවන්ගෙන් බැහැර ව දෛනික ජීවිතයෙහි ක්ෂුද්‍ර හැඟුම් වුව කවියට නගා ඇති බවත්,ඊට උචිත පොදු ජන ප්‍රිය බස් වහරක් උපයුක්ත කරගෙන ඇති බවත් ගම්‍ය විය. එමෙන් ම, ජන කවිය තුළ සංවාද කවිය පොදු ජන සන්නිවේදන මාධ්‍යයක් බවට පරිවර්තනය වීම හේතුවෙන් සිංහල පද්‍ය සාහිත්‍යය සුපෝෂණය වී ඇති බව ද මෙහි දී නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද-:*ජන කවිය,සංවාද කවි,සන්නිවේදන මාධ්‍යය,වාචෝද්ගත,පොදු ජන ප්‍රිය*

Major - [illegible]